# අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

**විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**

# කළමනාකරණ / ගිණුම් සහකාර (තාක්ෂණික නොවන) තනතුර සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 2005 අංක 32 දරන පනත යටතේ ස්ථාපිත කොට ඇති, අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීම සඳහා වන අධිකාරී බලය සතු ශ්‍රී ලංකාවේ එකම ආයතනයයි.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ / ගිණුම් සහකාර - තනතුරු 01

### සුදුසුකම් :

**බාහිර :**

ගණිතය, ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ යන විෂයන් ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් (පොදු පරීක්ෂණය හැර) විෂයයන් තුනකින් සමත් වී තිබීම.

අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි හා 45 ට අඩු අය විය යුතුය.

**වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය : MA 1-2 – 2016 – LKR 27,910 - 300x10 - 350x7 - 600x12 - 710x12 = 49,080**

**සටහන :** 2020-01-01- දක්වා සියලුම බඳවාගැනීම් සහ උසස්වීම් සඳහා වැටුප් ගෙවීම DMS චක්‍රලේඛ 02/2016 හි උපලේඛන II පරිදි සිදු කෙරේ.

මීට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. වෙනත් ප්‍රතිලාභ අතරට සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 3% ක් බැර කෙරේ.

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

තෝරාගන්නා අයදුම්කරු වසර තුනක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේ ඔහු / ඇය ගේ කාර්ය සාධනය හා පැවැත්ම සතුටුදායක නම් ස්ථිර සේවයේ පිහිටුවනු ලැබේ.

අයදුම්පත්, ජීවදත්ත ලේඛනය හා සහතිකවල පිටපත් සමඟ **සභාපති, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, අංක. 104 A, කිතුල්වත්ත පාර, බොරැල්ල** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. රජයේ හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයන් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2018 ඔක්තෝබර් 31 දින.**

**සභාපති**

**ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**